ih, yulu wejrK
*All Rights Reserved*

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 පස්කම් සුව විඳිමින්, අඹුදරුවන් පෝෂණය කරමින්, පින්දහම් කරමින් දිවිගෙවන උපාසක උපාසිකාවන් හැඳින්වෙන්නේ,
(1) ගිහියන් නමිනි. (2) පැවිද්දන් නමිනි.
(3) පෘථග්ජනයන් නමිනි. (4) ගෘහපති නමිනි.

02 පස් පව්, දස අකුසල් ආදිය නොකර සිටීම
(1) චාරිත්‍ර සීලයයි. (2) වාරිත්‍ර සීලයයි. (3) ගිහි සීලයයි. (4) පැවිදි සීලයයි.

03 මිගාර මාතා යන ගෞරව නාමය හිමිවූයේ,
(1) යසෝදරාවටයි. (2) කෝසල මල්ලිකාවටයි.
(3) විශාඛාවටයි. (4) කිසාගෝතමියටයි.

04 ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටුවිය යුතු යුතුකමක් නොවන්නේ,
(1) මැනවින් හික්මවීම (2) මැනවින් ඉගැන්වීම
(3) කරදරවලින් වළක්වා ගැනීම (4) අවශ්‍ය කටයුතු කරදීම

05 බුදුන්වහන්සේගේ ධර්මය මුල, මැද, අග මැනවින් දේශනාකර ඇති නිසා
(1) ස්වාක්ඛාත නම් වේ. (2) සන්දිට්ඨික නම් වේ.
(3) අකාලික නම් වේ. (4) ඒහිපස්සික නම් වේ.

06 ''ඇවැත්නි, ශෝක නොකරන්න. නොවැලපෙන්න. අප දැන් ඒ මහා ශ්‍රමණයන් වහන්සේගෙන් නිදහස් වුනා.'' බුදුන් වහන්සේ පිරිනිවන් පෑ මොහොතේ මෙසේ ප්‍රකාශ කළේ,
(1) පුණ්ණ තෙරුන්ය (2) අනඳ තෙරුන්ය
(3) සුභද්‍ර භික්ෂුවය (4) උපාලි තෙරුන්ය

07 තමන් වැරදි කිරීමෙන් වැළකී සිටීම, අනුන් ලවා වැරදි නොකරවීම, අනුන්ට වැරදි කිරීමට අනුබල නොදීම යන මේවා
(1) පංචශීලයයි. (2) ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලයයි.
(3) ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයයි. (4) ආජීව ශීලයයි.

08 මෙලොව දියුණුව සඳහා ඉවහල්වන ''සමජීවකතා යනු''
(1) උත්සාහ සම්පත්තියයි. (2) ආරක්ෂා සම්පත්තියයි.
(3) කල්‍යාණ මිත්‍ර සම්පත්තියයි. (4) අයවැය සමව පවත්වාගැනීමයි.

09 පොසොන් පොහොය දින අපට වැදගත් වන්නේ,
(1) දේවානම් පියතිස්ස රජු මුවකු පසුපස හඹාගිය නිසා
(2) පොසොන් උත්සව පැවැත්වීම නිසා
(3) බුදුදහම ශ්‍රී ලාංකිකයන් වෙත දායාද වීම නිසා
(4) සිල්සමාදන් විය හැකි නිසා

10 පන්සිල්වල පළමු සිල්පදය වන්නේ,
(1) අසම්මත, අශිෂ්ට හැසිරීම්වලින් ඉවත්වීමයි.
(2) ජීවිත විනාශ කිරීමෙන් වැළකී සිටීමයි.
(3) නොදුන් දෙය ගැනීමෙන් වැළකී සිටීමයි.
(4) අනුන් රැවටීමේ, මුලාකිරීමේ අදහසින් අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමයි.

11 ''මහණෙනි, තථාගතයන්ට නාමයෙන්ද ආවුසෝ කියාද කතා නොකරව්. මහණෙනි, තථාගත තෙමේ රහත්ය. සම්‍යක් සම්බුද්ධ ය'යි වදාළහ.'' බුදුන්වහන්සේ මෙම ප්‍රකාශය කළේ,
(1) පස්වග තවුසන්ටය. (2) භද්දවග්ගිය භික්ෂූන්ටය.
(3) වජ්ජි පුත්තක භික්ෂූන්ටය. (4) කොසඹෑ නුවර භික්ෂූන්ටය.

12 ඉපැරණි ශ්‍රී ලංකාවේ රුහුණෙහි පිහිටි අධ්‍යාපන ආයතනයකි
(1) මහා විහාරය (2) අභයගිරි විහාරය
(3) තිස්සමහාරාම විහාරය (4) ජේතවන විහාරය

13 ඔබ උපයන මුදලින් පරිභෝජනය සඳහා ගතයුත්තේ
(1) කොටස් දෙකකි. (2) කොටස් එකකි.
(3) කොටස් භාගයකි. (4) සියල්ලමය.

14 ඉවසීමේ ගුණය ප්‍රකට වන ජාතක කතාව වන්නේ,
(1) වෙස්සන්තර ජාතකයයි. (2) සුතසෝම ජාතකයයි.
(3) අපණ්ණක ජාතකයයි. (4) ක්ෂාන්තිවාදී ජාතකයයි.

15 ආයර්‍ය සත්‍ය සතර පිළිබඳ පියවර හෙවත් පිරිවැටුම් ගණන,

(1) තුනකි. (2) හතරකි. (3) දොළහකි. (4) හයකි.

16 දම්සක් පැවැත්වීම නම් චතුරාර්‍ය සත්‍ය දේශනා කිරීමම බව බුදුන්වහන්සේ දේශනා කළේ,

(1) අම්බට්ඨ සූත්‍රයේ දී ය. (2) පොට්ඨපාද සූත්‍රයේ දී ය.

(3) මහාවග්ගපාලියේ දී ය. (4) සච්චවිභංග සූත්‍රයේ දී ය.

17 ලෝවැඩ සඟරාවේ කතුවරයා වන්නේ,

(1) වීදාගම හිමියන්ය. (2) රාහුල හිමියන්ය.

(3) ධර්මසේන හිමියන්ය. (4) බුද්ධඝෝෂ හිමියන්ය.

18 ඉර උදාවෙන්නට - පළමුව නැගිට සිහිකොට
මෙම පද්‍ය ඇතුළත් කෘතිය වන්නේ,

(1) කාව්‍යශේඛරය (2) සිරිත් මල්දම

(3) ලෝවැඩ සඟරාව (4) බුදුගුණාලංකාරය

19 සුනාපරන්තවාසී පුණ්ණ තෙරුන් ප්‍රකට වූයේ,

(1) ඉවසීම පිළිබඳවයි. (2) බණ කීම පිළිබඳවයි.

(3) ධර්ම සාකච්ඡා කිරීම පිළිබඳවයි. (4) කරුණාව පිළිබඳවයි.

20 තම බිසෝවරුන් බෝසත් තාපස තුමාගෙන් බණ අසනවා දැක කෝපයට පත්වූයේ

(1) කණිෂ්ක රජු (2) කලාබු රජු (3) මහසෙන් රජු (4) අජාසත්ත රජු

(2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. තෝරාගත් අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි.**

01 (1) මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූත පිරිස ලක්දිවට වැඩියේ කිනම් රජු දවසද?

(2) මෙරට බෝධිසත්ව පිළිම දක්නට ලැබෙන ස්ථාන දෙකක් ලියන්න.

(3) ප්‍රථම ධර්ම දේශනාව කිරීම සඳහා බුදුන්වහන්සේ වැඩම කළේ කොහාටද?

(4) ''විරමණය'' යනු කුමක් ද?

(5) ''සත්හට වන බව දුකට වෙදාණන්'' යනුවෙන් බුදුන්වහන්සේ හඳුන්වා ඇති කෘතිය කුමක් ද?

(6) ''මිගාර මාතා'' යනුවෙන් හඳුන්වන්නේ කවුද?

(7) ගොවි කටයුතුවලදී තමනට උපකාර කළ අනික් ගොවියනට උපකාර කිරීම් වශයෙන් වැඩකරදීම හඳුන්වන නම කුමක් ද?

(8) පළමු සංගායනාව හඳුන්වන වෙනත් නමක් ලියන්න.

(9) ධර්මරත්නයේ ගුණ කීයද?

(10) සදිසා සමාජ ක්‍රමය පිළිබඳ ඉගැන්වෙන සූත්‍රය කුමක් ද?

02 (1) මුල මැද හා අගද - යහපත් ලෙසට මුනි සඳ
දෙසුයෙන් දහම් කඳ - ස්වාක්ඛාතය කියා නම් ලද
මෙහි සඳහන් ධර්මරත්නයේ ගුණය ලියන්න.

(2) එම පද්‍යයේ තේරුම ලියන්න.

(3) ධර්මරත්නයේ ගුණ හැඳිනගෙන ක්‍රියාකිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න.

03 (1) පළමු සංගායනාවට හේතු පාදක වූ කරුණු දෙකක් දක්වන්න.

(2) පළමු සංගායනාවේ දී කළ දේ පැහැදිලි කරන්න.

(3) පළමු සංගායනාවේ වැදගත්ම ප්‍රතිඵලය විස්තර කරන්න.

04 (1) ඉර උදාවන්නට - පළමුව නැගිට සිහිකොට
ඉහත පද සම්පූර්ණ කරන්න.

(2) ආහාර ගැනීමේ දී අනුගමනය කළයුතු සිරිත් විරිත් තුනක් ලියන්න.

(3) යහපත් දරුවකු වීමට අනුගමනය කළයුතු බෞද්ධ සිරිත් විරිත් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

05 (1) මෙත් වඩන්නකු තුළ ඇතිකරගත යුතු ගුණාංග දෙකක් ලියන්න.

(2) මෙත් වැඩීමේ අනුසස් තුනක් ලියන්න.

(3) කරණීයමෙත්ත සූත්‍රයේ නිදාන කතාව කෙටියෙන් ලියන්න.

06 (1) යහපත් ලෙස සහ අයහපත් ලෙස ධනය පරිහරණය කරන පුද්ගලයින් දෙදෙනා නම් කරන්න.

(2) ඔවුන්ගේ ගති ලක්ෂණ පැහැදිලි කරන්න.

(3) අපට ලැබෙන ධනය කොටස් කර පරිහරණය කරන අයුරු ලියා දක්වන්න.

07 (1) බුදුන්වහන්සේ චතුරාර්‍ය සත්‍යය පළමුවරට හඳුන්වා දුන් සූත්‍රය නම් කරන්න.

(2) චතුරාර්‍ය සත්‍යය ''සමුක්කංසික'' දේශනාව යනුවෙන් හැඳින්වීමට හේතු දක්වන්න.

(3) ආර්‍ය සත්‍යය පිළිබඳ වූ පිරිවැටුම් තුන පැහැදිලි කරන්න.